
# දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - වවුනියාව
# மாவட்ட செயலகம் - வவுனியா
# District Secretariat - Vavuniya




ආයතනයේ නම:- **දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - වවුනියාව**

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

நிறுவனத்தின் பெயர்: **மாவட்ட செயலகம், வவுனியா**

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Name of the Institution:- **District Secretariat – Vavuniya**

Submission of observations of Hon.Minister and steps taken with regard to the reports tabled by the Parliamentary Committee on Public Accounts in terms of Standing Order No.119(4)

# 2023

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තු පොදු ගිණුම් පිළිබඳ කාරක සභාවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට තොරතුරු සැපයීම**

පාර්ලිමේන්තු ප්‍රකාශන අංක: 492

ආයතනයේ නම: වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

| අංකය | රජයේ ගිණුම් කාරක සභාව පෙන්වා දුන් අඩුපාඩු සහ උපදෙස් | ගණන් දීමේ නිලධාරියා විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග සහ වර්තමාන ප්‍රගතිය |
|---|---|---|
| 01 | ඇප ලේඛනය යාවත්කාලීන කර නොතිබීම. | ඇප ලේඛනය දැනට යාවත්කාලීන කර ඇත. |
| 02 | ණය ගැති ලේඛනය යාවත්කාලීන කර නොතිබීම. | 2024 වර්ෂයේ සිට ණය ගැති ලේඛනය යාවත්කාලීන කර ඇත. |
| 03 | උප පත්‍රිකා පොත් ලේඛනය (Counterfoil Book) නිසි පරිදි පවත්වාගෙන නොතිබීම. | 2024 වර්ෂයේ සිට උප පත්‍රිකා පොත් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලැබේ. |
| 04 | වාහන ලැයිස්තු ගත කිරීමේ ලේඛනය යාවත්කාලීන කර නොතිබීම. | 2025 වර්ෂයේ සිට වාහන ලැයිස්තු ගත කිරීමේ ලේඛනය යාවත්කාලීන කර ඇත. |
| 05 | අනවසර අල්ලා ගැනීම් පිළිබඳ ලේඛනය නිසි පරිදි පවත්වාගෙන නොතිබීම. | අනවසර අල්ලා ගැනීම් පිළිබඳ තොරතුරු පරිගණකගත කර ඇති අතර, මෙම මූල්‍ය වර්ෂයේ සිට එම ලේඛනය පවත්වාගෙන යනු ලැබේ. |
| 06 | අවදානම් පිළිබඳ ලේඛනය නිසි පරිදි පවත්වාගෙන නොතිබීම. | 2024 වසරේ සිට අවදානම් ලේඛනය පවත්වාගෙන යන අතර, එය පදනම් කරගෙන අභ්‍යන්තර විගණන සැලසුම් සකස් කර ඇත. මෙම ක්‍රියාවලිය සෑම මූල්‍ය වර්ෂයක් පාසා අනුගමනය කරනු ලැබේ. |
| 07 | මෘදුකාංග සඳහා වන පළමු මුරපදය (Password) ගණකාධිකාරී හෝ බලයලත් නිලධාරියෙකු පමණක් භාවිත නොකිරීම. | 2025 වර්ෂයේ සිට මෘදුකාංගයේ පළමු මුරපදය ගණකාධිකාරීවරයා විසින් පමණක් භාවිත කරනු ලැබේ. |

| අංකය | රජයේ ගිණුම් කාරක සභාව පෙන්වා දුන් අඩුපාඩු සහ උපදෙස් | ගණන් දීමේ නිලධාරියා විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග සහ වර්තමාන ප්‍රගතිය |
|---|---|---|
| 08 | මෘදුකාංගයේ 1, 2 සහ 3 මුරපද මාස තුනකට වරක් වෙනස් නොකිරීම. | 2025 වර්ෂයේ සිට රජයේ ගිණුම් චක්‍රලේඛ 171/2004 අනුව සෑම මාස තුනකට වරක් මුරපද වෙනස් කරනු ලැබේ. |
| 09 | විගණකාධිපතිවරයාගේ විමසුම් සඳහා මාසයක් ඇතුළත පිළිතුරු යොමු නොකිරීම. | විගණකාධිපතිවරයාට දින 3ක් ඇතුළත තාවකාලික පිළිතුරු ලබා දෙන අතර, මාසයක් ඇතුළත සම්පූර්ණ පිළිතුරු යැවීමට පියවර ගෙන ඇත. |
| 10 | සුදුසු නිලධාරියෙකු පත් කර කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත දැනුම් නොදීම. | චක්‍රලේඛ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා 2026.01.01 දින සිට ප්‍රධාන ගණකාධිකාරී එම්. යේසුරෙජිනෝල්ඩ් මහතා පත් කර ඇත. |
| 11 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 අනුව කටයුතු නොකිරීම. | දැනට කල් ඉකුත් වූ තැන්පතු කිසිවක් නොමැති අතර අදාළ ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| 12 | මු.රෙ. 371 අනුව අනුමත සීමාව ඉක්මවා අත්තිකාරම් ගෙවා තිබීම. | දැනට මු.රෙ. 371 අනුව අනුමත සීමාවන් තුළ පමණක් අත්තිකාරම් නිකුත් කරනු ලැබේ. |
| 13 | අග්‍රිම සැසඳුම් ප්‍රකාශනයෙන් අනාවරණය වූ වෙනස්කම් හඳුනාගෙන නොතිබූ අතර ඒවා නිවැරදි කිරීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | දැනට එම සැසඳුම් සිදු කර ඇති අතර, නැවත එවැනි වෙනස්කම් ඇති නොවන පරිදි කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. |
| 14 | එකතු කරන ලද ආදායම් සෘජුවම ආදායමට බැර කර හෝ ඒවා තැන්පත් ගිණුමේ රඳවා ගෙන මාසයකට වඩා අඩු කාලයක් ඇතුළත ආදායම් ගිණුමට බැර නොකිරීම. | දැනට එකතු කරන ලද ආදායම් මාසයක් ඇතුළත ආදායම් ගිණුමට බැර කරනු ලැබේ. |
| 15 | 2017.09.20 දිනැති අංක 04/2017 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව ආයතනයේ යාවත්කාලීන කරන ලද කාර්ය මණ්ඩල තොරතුරු සෑම කාර්තුවක් අවසාන වී මසක් ඇතුළත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු නොකිරීම. | සෑම කාර්තුවකම අවසානයේ මාසයක් ඇතුළත කාර්ය මණ්ඩල තොරතුරු යොමු කරන අතර, අවසන් වරට 2026.04.06 දින එම වාර්තා යොමු කර ඇත. |

| අංකය | රජයේ ගිණුම් කාරක සභාව පෙන්වා දුන් අඩුපාඩු සහ උපදෙස් | ගණන් දීමේ නිලධාරියා විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග සහ වර්තමාන ප්‍රගතිය |
|---|---|---|
| 16 | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් මාසිකව නොපැවැත්වීම. | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම්ගේ 2025.09.01 දිනැති අංක 03/2025 දරණ චක්‍රලේඛය අනුව කාර්තුවකට වරක් රැස්වීම් පවත්වන අතර, 2026 වසරේ පළමු රැස්වීම 2026.02.26 දින පවත්වා ඇත. |
| 17 | ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ රැස්වීම් දිස්ත්‍රික් ලේකම් විසින් මාසිකව නොපැවැත්වීම. | දැනට දිස්ත්‍රික් ලේකම්වරයා විසින් ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ රැස්වීම් මාසිකව පවත්වනු ලැබේ. |
| 18 | දිස්ත්‍රික් නිවාස කමිටුව මාසිකව රැස් නොවීම. | 2025 වර්ෂයේ සිට සැලසුම් සහගතව රැස්වීම් පවත්වන අතර, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී ද මේ සම්බන්ධ කරුණු සාකච්ඡා කෙරේ. |
| 19 | ආයතනයේ ගිණුම් සම්බන්ධයෙන් ලබා දී තිබූ විගණන මතය සුදුසුකම් සහිත මතයක් / මතය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටීමක් / අහිතකර මතයක් විය. | 2024 වර්ෂයේදී යහපත් (Qualified) විගණන වාර්තාවක් ලැබී ඇත. |
| 20 | අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශයේ 2/2018 දරන චක්‍රලේඛයට අනුව ආයතනය විසින් ඉටු කළ යුතු මූලික සේවාවන් 05ක් හඳුනා ගැනීමට අපොහොසත් වී තිබූ අතර හඳුනාගත් සේවාවන් සඳහා ඉලක්ක ද නියම කර නොතිබුණි. | ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ 2/2018 චක්‍රලේඛය අනුව එම සේවාවන් 2022 වසරේදී හඳුනාගෙන ඇත. |
| 21 | හඳුනාගත් සේවාවන් සඳහා ඉලක්ක තීරණය කර නොතිබීම. | හඳුනාගත් සේවාවන් සඳහා ඉලක්ක 2022 වර්ෂයේදී නියම කර ඇති අතර ඒවා අඛණ්ඩව නියම කරමින් පවතී. |
| 22 | කාර්ය සාධන අරමුණු නියමිත දිනට ඉදිරිපත් කර නොතිබීම. | 2023.02.09 දින ඉදිරිපත් කර ඇත. දැනට ඉලක්ක නියමිත දිනවලදී ඉදිරිපත් කරනු ලැබේ. |
| 23 | කාර්ය සාධන දර්ශකයේ ජයග්‍රහණය 24%ට වඩා අඩු මට්ටමක පැවතීම. | 2025 වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඉලක්ක සපුරා ගැනීමේ ප්‍රතිශතය 90% දක්වා ළඟා වී ඇත. |

| අංකය | රජයේ ගිණුම් කාරක සභාව පෙන්වා දුන් අඩුපාඩු සහ උපදෙස් | ගණන් දීමේ නිලධාරියා විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග සහ වර්තමාන ප්‍රගතිය |
|---|---|---|
| 24 | සැලසුම් කර තිබූ පුහුණු අවස්ථාවන් අතරින් ලබාදී තිබූ පුහුණු අවස්ථාවන්ගේ ප්‍රමාණය 50% ට අඩු විය. | 03/2022 දරන චක්‍රලේඛය අනුව වියදම් පාලනය කිරීම හේතුවෙන් ආරම්භයේදී ඉලක්ක සපුරා ගැනීමට නොහැකි විය. කෙසේ වෙතත්, 2025 වර්ෂයේ සිට මාසික පුහුණු සැසි 4ක් පවත්වමින් 100% ඉලක්ක සපුරා ඇත. |
| 25 | විගණකාධිපතිවරයාගේ වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම. | මෙ දක්වා ලබා දී ඇති සියලුම උපදෙස් සහ නිර්දේශ ක්‍රියාත්මක කර ඇත. |
| 26 | සියලුම රජයේ නිලධාරීන් වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් නොකිරීම. | 2025 වර්ෂයේ සිට සියලුම අදාළ නිලධාරීන් සිය වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර ඇත. |
| 27 | දිස්ත්‍රික් පරිසර කමිටුව මාස දෙකකට වරක්වත් රැස් නොවීම. | රැස්වීම් කාලසටහන ක්‍රියාත්මක කර තිබුණි. ආපදා කළමනාකරණ, ඉඩම් පරිහරණ හා කෘෂිකර්ම කමිටුවලදී ද එම කරුණු සාකච්ඡා කරනු ලැබේ. ඉදිරි මූල්‍ය වර්ෂයේ සිට මාස දෙකකට වරක් රැස්වීම් පැවැත්වීමට තීරණය කර ඇත. |

පී.ඒ.සරත්චන්ද්‍ර
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
වවුනියාව

පැතුම අනුරාධ සරත්චන්ද්‍ර
දිස්ත්‍රික් ලේකම්/දිසාපති,
වවුනියාව.

එම්.යේසුරෙජිනෝල්ඩ්
ප්‍රධාන ගණකාධිකාරී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
වවුනියාව

එම්.ජේසු රෙජිනෝල්ඩ්
ප්‍රධාන ගණකාධිකාරී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
වවුනියාව

## ලේකම්තුමාගේ නිර්දේශය

දිස්ත්‍රික් ලේකම් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග නිර්දේශ කරන අතර පෙන්වා දී ඇති අඩුපාඩු සම්බන්ධයෙන් පෞද්ගලික අවධානය යොමු කරමින් ඒවා නිවැරදි කරන ලෙස දිස්ත්‍රික් ලේකම්ට උපදෙස් ලබා දී ඇත.

එස්.ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය

## ඇමතිතුමාගේ නිර්දේශය හා ගෙන ඇති ක්‍රියාමාර්ග

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී ඇති උපදෙස් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් එම අඩුපාඩු නැවත ඇති නොවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මා විසින් අමාත්‍යාංශ ලේකම්තුමා වෙත උපදෙස් ලබා දී ඇති අතර එම ක්‍රියා මාර්ග 2026 වර්ෂය තුල දී සාධනීය මට්ටම ප්‍රශස්ත මට්ටමට ළගා කර ගැනීමට අපේක්ෂා කරමි.

මහාචාර්ය ඒ.එච්.එම්.එච්.අබයරත්න (පා.ම.)
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය

මහාචාර්ය ඒ.එච්.එම්.එච්. අබයරත්න
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍ය
නිදහස් චතුරස්‍රය - කොළඹ 07.